**සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම - 2016**

---------------------------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ('මණ්ඩලය') වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

--------

මූල්‍ය ප්‍රකාශනවලින්, 2016 දෙසැම්බර් 31 දිනට සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**
**--------------------------------------------------------------------------**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මාගේ මතය අනුව,

- විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නාවූ මතය වේ.

**3. මූල්‍ය සමාලෝචනය**
**------------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**
**------------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් ලද මූල්‍ය ප්‍රතිඵලය රු.110,224,038 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.117,612,550 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,388,512 ක පිරිහීමක් පෙන්නුම් කරයි. සමාලෝචිත වර්ෂය තුල පරිපාලන වියදම රු.180,059,936 කින් වැඩිවීම මෙම මූල්‍ය ප්‍රතිඵලය මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතුව වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**
**------------------------------**

**4.1 කාර්යසාධනය**
**-----------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ ආදායම් හඳුනාගැනීමේ ප්‍රකාශනය අනුව, 2016 දෙසැම්බර් 31 දිනට මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශය (සීඊසීබී) විසින් රු.8,697,350,179 ක් වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 683 ක් සමාගමට උපකොන්ත්‍රාත් ලෙස ලබා දී තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් උපකොන්ත්‍රාත් ගිවිසුම් 639 ක් විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, වටිනාකම රු. 2,397,469 ක්වූ ගිවිසුම් 44 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල සම්පූර්ණයෙන් අවසන් කර තිබූ ඉදිකිරීම් ව්‍යාපෘති 72 කින් ලද ආදායමට වඩා වියදම අධික වීම නිසා දකුණු, බත්තරමුල්ල, අනුරාධපුර, ඌව, ජාවත්ත, මධ්‍යම පළාත සහ පොළොන්නරුව වැනි මූලස්ථාන කාර්යාල විසින් රු.369,988,706 ක පාඩු දරා තිබුණි.

## 5 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත වාර්ෂික ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. කෙසේ වුවද, සමාගම විසින් දළ වශයෙන් මාස තුනක පමාවීමක් සහිතව 2017 සැප්තැම්බර් 04 දින මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 06 දින ඉදිරිපත් කර තිබුණි.

### 5.2 ප්‍රසම්පාදන කළමනාකරණය

ප්‍රසම්පාදන මග පෙන්වීම් අත්පොතේ 6.2 හා 6.2.2 මග පෙන්වීම් අනුව නැෂනල් ෂොපින් ක්‍රමය (National Shopping) යටතේ වන ලංසු තබන්නන්ට තම ලංසු ඉදිරිපත් කිරීම සඳහා අවම වශයෙන් දින 07 ක් ලබාදිය යුතුව ඇත. කෙසේ වුවද,සමාලෝචිත වර්ෂය තුළ රු.11,119,333 ක් වටිනාකමැති මිලදී ගැනීම් සම්බන්ධයෙන් මූලස්ථාන කාර්යාල වන ජාවත්ත ව්‍යාපෘතිය සහ බත්තරමුල්ල අනෙකුත් ව්‍යාපෘති 05 ක් සඳහා ලංසු ඉදිරිපත් කිරීමට දින 01 සිට දින 03 දක්වා කාලයක් පමණක් ලබාදී තිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණන කටයුතුවලදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානය සඳහා ඉදිරිපත් කරන ලදී. පහත ක්ෂේත්‍ර සඳහා විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | අදාල පාර්ශව වලින් සනාථ කර ගැනීමකින් තොරව ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ වර්ෂ 04 කට වඩා වැඩි කාලයක් පැවතුණි. |
| (ආ) ඉන්වෙන්ට්‍රි පාලනය හා තොග කළමනාකරණය | සමාලෝචිත වර්ෂය අවසානයට වැඩබිම්වල පැවති ඉන්වෙන්ට්‍රි හා තොග අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. |
| (ඇ) ඉන්වොයිස් කිරීම | ඉදිකිරීම් කොන්ත්‍රාත්වලට අදාල සත්‍ය කළ වැඩ ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. |